**ශිර්ෂය 273  පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ  හා 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාළ විගණන නිරික්ෂණ දැක්වේ.

## 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| | | | |
|---|---|---|---|
| (i) | පුත්තලම | (ix) | මහකුඹුක්කඩවල |
| (ii) | ආණමඩුව | (x) | ආරච්චිකට්ටුව |
| (iii) | කරුවලගස්වැව | (xi) | හලාවත |
| (iv) | නවගත්තේගම | (xii) | වෙන්නප්පුව |
| (v) | පල්ලම | (xiii) | නාත්තන්ඩිය |
| (vi) | මුන්දලම | (xiv) | මහවැව |
| (vii) | වනාතවිල්ලුව | (xv) | දංකොටුව |
| (viii) | කල්පිටිය | (xvi) | මාදම්පේ |

### 1.1 විගණන විෂය පථය

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූලි 23 දින පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන

අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

### 2.1 විසර්ජන ගිණුම

----------------

**(අ) මුළු ප්‍රතිපාදන හා වියදම්**

---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 526.63 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 521.41 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම රු.මිලියන 5.22 ක් වී තිබූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.99 ක් වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 488.23 | 483.97 | 4.26 | 0.87 |
| මුලධන | 38.40 | 37.44 | 0.96 | 2.50 |
| **එකතුව** | **526.63** | **521.41** | **5.22** | **0.99** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

------------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 25 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 257.11 ක් හා රු.මිලියන 1,087.21 ක් වශයෙන් එකතුව රු.මිලියන 1,344.32 ක ප්‍රතිපාදන ලබා දි තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 230.43 ක් හා රු.මිලියන 1,048.80 ක් වශයෙන් එකතුව රු.මිලියන 1,279.23 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.මිලියන 26.68 ක් හා රු.මිලියන 38.41 ක් වශයෙන් එකතුව රු.මිලියන 65.09 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි.

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27301 | 45.0 | 39.3 | 33.0 | 30.7 | 168.0 | 143.0 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.මිලියන 320.37 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ---------------- | ------------------- | ----------- |
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | විගණන විමසුම් ලේඛනය | මුදල් රෙගුලාසි 452(1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) | මුදල් පොත | මුදල් රෙගුලාසි 446 | ආරච්චිකට්ටුව හා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඉ) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඊ) | තොග පොත | මුදල් රෙගුලාසි 751 හා 763 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (උ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඌ) | විදුලි උපකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (එ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඒ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | වාහන ලොග් පොත් | මුදල් රෙගුලාසි1645 (අ) | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඕ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) | පවත්වා නොතිබුණි. |
| (ක) | ණය සහ අත්තිකාරම් ලේඛනය | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9(1) ඡේදය | ණය අත්තිකාරම් ලේඛනය පවත්වා නොතිබුණු අතර ණය ලේඛනය සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යාවත්කාලීන කර නොතිබුණි. |
| (ග) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවේ පැමිණීමේ ලේඛන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ජ) | කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:11.3 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඩ) | ලංසු කැඳවීම් ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

-----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 12 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කරන ලද විගණන විමසුම් 03 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.77,723,234 ක් විය.

**3.3 සීමා නොපිළිපැදීම**

--------------------

විෂය අංක 27301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ අවම ලැබීම් සීමාව රු.33,000,000 ක් වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට තථ්‍ය ලැබීම් රු.30,737,538 ක් වී තිබුණි. ඒ අනුව රු.2,262,462 කින් අවම ලැබීම් සීමාවට ළඟා වී නොතිබුණි.

## 3.4 විසර්ජන ගිණුම

### 3.4.1 අයවැය විචලනය

වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක සිට සියයට 72 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකරණ අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.564,898 කින් ඉක්මවා උපයෝජනයන් කර තිබුණි.

(ආ) කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය විසින් ලබා දී තිබු රු.35,212 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අදාළ කාර්ය සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශයකින් හා දෙපාර්තමේන්තු දෙකකින් ලබා දී තිබු ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය එම ප්‍රතිපාදනයෙන් සියයට 65 ක් වී තිබුණි.

(ඈ) අමාත්‍යාංශ 11 ක් හා දෙපාර්තමේන්තු 14 ක් විසින් ලබා දි තිබුණු ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය සියයට 05 ක ප්‍රමාණය ඉක්මවා තිබුණි.

## 3.5 අග්‍රිම ගිණුම

මාදම්පේ හා පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් තිදෙනෙක් වෙත මුදල් රෙගුලාසි 371 ට අනුකුල නොවී රු.20,000 ක සිමාව ඉක්මවූ එකතුව රු.170,800 ක තත්කාර්ය අතුරු අග්‍රිම අවස්ථා 3 කදී නිකුත් කර තිබුණි.

## 3.6 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.25,999,981 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ආරච්චිකට්ටුව, පල්ලම හා ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණු රු.21,003,774 ක ප්‍රතිපාදන අදාල කාර්යයභාර්යන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 27301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.7,468,973 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආපදා ණය ගෙවීමේ දී 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය නොකර රු.2,423,726 ක ආපදා ණය නිලධාරීන් වෙත ගෙවා තිබුණි.

## 3.8 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 3.8.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට අදාලව අභ්‍යන්තර විගණන විමසුම් 18 ක් නිකුත් කර තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා විගණන විමසුම් නිකුත් කර නොතිබුණි.

**3.8.2 විගණන හා කළමනාකරණ කමිටුව**

**-------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටුව කාර්තුවකට එක් කමිටු රැස්වීමක් බැගින් වර්ෂයකට කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කමිටු රැස්වීම් වාර 2ක් පමණක් පවත්වා තිබුණි.

**3.9 වත්කම් කළමනාකරණය**

**---------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | | වර්ෂ |
| (i) | ගොඩනැඟිලි | 02 | 01ට වැඩි |
| (ii) | මෝටර් වාහන | 01 | 01ට වැඩි |
| (iii) | යන්ත්‍ර සූත්‍ර | 07 | 01ට වැඩි |
| (iv) | වෙනත් වත්කම්(පාපැදිය) | 01 | 01ට වැඩි 04ට අඩු |

**(ආ) බේරුම් නොකල බැරකම්**

**----------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ එකකට අඩු කාලයක සිට පැවැත එන රු.1,035,819 ක බැරකම් පැවැතුණි

**3.10 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**---------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 109 | 2,701,315 | පොත්වලින් කපා නොහළ පාඩු හා හානි 2 ක් හා වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2004/2005 මහ, 2005 යල හා 2005/2006 මහ කන්න සහ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2004/2005 මහ හා 2005 යල කන්නවල නොපියවූ අත්තිකාරම්වල පාඩුව විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි. |
| (ii) මු.රෙ. 110 | 2,485,367 | හානි 22 ක තොරුතුරු පාඩු හා හානි ලේඛනයේ දක්වා නොතිබුණි. |
| (iii) මු. රෙ. 396 | 32,384 | ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්මවූ චෙක්පත් 10 ක් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| (iv) මු. රෙ. 571 | 25,315,735 | පොදු තැන්පත් පිළිබඳ අර්ධ වාර්ෂික විස්තර ඉදිරිපත් කර නොතිබුණු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක වර්ෂ 2ක් ඉක්මවූ තැන්පත් පිළිබඳව නියමිත පරිදි කටයුතු කර නොතිබුණි. |
| (v) මු.රෙ. 1645 හා 1646 | -- | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචිත වාහන 07 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(IV) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 ජුනි | -- | සංචිත වාහන 04 ක දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

29 දිනැති අංක 13/2008 චක්‍රලේඛය

(ii) 2013 ජුලි 04 දිනැති අංක 14/2013 දරන චක්‍රලේඛය -- චක්‍රලේඛය උපදෙස්වලට පටහැනිව කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ රාජකාරී කටයුතු සංවර්ධන නිලධාරීන්ට පවරා තිබුණි.

**3.11 විදේශාධාර ව්‍යාපෘති**

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බැංකු ගිණුමට 2014 දෙසැම්බර් 12 දින රු.10,118,500 ක විදේශාධාර මුදලක් ලැබී තිබුණි. එම මුදල නිවැරදිව හඳුනා නොගෙන 2015 මාර්තු දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශවල හඳුනා නොගත් ලැබීම් වශයෙන් සඳහන් කර තිබුණු අතර 2015 අප්‍රේල් මාසය දක්වා ප්‍රමාද කර ගිණුම්ගත කර තිබුණි.

**3.12 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳ නියැදි විගණන පරීක්ෂණයන්ගෙන් අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් එකතුව රු.12,172,212 ක ඇස්තමේන්තුගත වටිනාකමක ව්‍යාපෘති 108 ක් ආරම්භ කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම කර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ප්‍රදේශීය ලේකම් කාර්යාල 02 ක ව්‍යාපෘති 46 ක් ආරම්භකර ඒ සඳහා රු.18,747,067 ක් වැය කර තිබුණි. පසුව එම ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි.

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් එකතුව රු.220,777,022 ක ඇස්තමේන්තු පිරිවැය වූ ව්‍යාපෘති 414 ක් නියමිත කාල වකවානුව තුළ නිමකර නොතිබුණි. එම ව්‍යාපෘති වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දින

වන විට එකතුව රු.51,076,186 ක් වැය කර තිබුණි. එම ව්‍යාපෘති නිම කිරීම සඳහා මාස 01 ක සිට මාස 06 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි.

**3.13 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා කිහිපයක් නිරීක්ෂණය විය..

(අ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මයික්කුලම ආයුර්වේද මධ්‍යස්ථානයේ වෛද්‍ය නේවාසිකාගාරය ඉදිකිරීමට රු.674,194 ක් වැය කර තිබුණද, එහි දොර ලෑල්ලක කොටසක් දොරෙන් වෙන්වන තරමට පුපුරා තිබුණි.

(ආ) පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එකතුව රු.23,106,246 ක ඇස්තමේන්තුගත විටිනාකමක් ඇති ජල ව්‍යාපෘති 10 ක් ආරම්භකර තිබුණද, ඒවායේ වැඩ නිම කර නොතිබුණි. එම ව්‍යාපෘති සඳහා නැවත ප්‍රතිපාදන නොලැබීම නිසා 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වී තිබුණි.

**3.14 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

සංචාරක පුරවරයක් පිහිටුවීම සඳහා කල්පිටිය දූපත් 14 ක ඉඩම් අත්පත් කරගැනීමට කල්පිටිය ලංකා බැංකු ශාඛාවේ රුපියල් මිලියන 31 ක් තැන්පත් කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.15 අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු**

------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගනුදෙනු සිදුකර තිබුණි.

(අ) 2013 පෙබරවාරි 11 දිනැති අංක MFD/S/S/1 දරන මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට පටහැනිව පල්ලම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සඳහා රු.152,540 ක් වැයකර උපකරණ ලබාදී තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියකින් තොරව එම අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටුකළ කර්මාන්තවල පරිපාලන වියදම්වලින් රු.515,994 ක ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

(ඇ) ව්‍යාපෘති කිහිපයකට සළසා තිබූ රු.400,000 ක ප්‍රතිපාදන අනුමැතියකින් තොරව වෙනත් ව්‍යාපෘතිවලට යොදවා තිබුණි.

(ඈ) නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දහම් පාසල් 03 ක ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා එකතුව රු.300,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, විධිමත් අනුමැතියකින් තොරව වෙනත් ව්‍යාපෘති සඳහා එම ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

## 3.16 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

---------------------------------------

කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරිසර හා ළමා උද්‍යානයක් ඉදිකිරීමේදී එහි අත්තිවාරමට බොරළු නොපුරවා රු.152,544 ක් ලබාගෙන තිබුණි.

## 3.17 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) වනාතවිල්ලුව, නවගත්තේගම හා කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ග්‍රාමීය ස්වේච්ඡා සංවිධානවලට බෙදාදීම සඳහා මිලදී ගෙන තිබූ එකතුව රු.3,657,415 ක සංවර්ධන භාණ්ඩ 2015 මාර්තු මාසය අවසන් වන විටත් එම භාණ්ඩ අදාළ සංවිධානවලට බෙදා දී නොතිබුණි.

(ආ) නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් මාසයේදී ලියා අත්සන් කර තිබූ රු.140,875 ක් වටිනා චෙක්පත් 33 ක් අදාල තැනැත්තන්ට භාර නොදී 2015 මැයි මාසය වන විටත් අත රඳවා ගෙන තිබුණි.

## 3.18 මානව සම්පත් කලමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 55 | 49 | 06 | -- |
| (ii) | තෘතියික මට්ටම | 34 | 15 | 19 | -- |
| (iii) | ද්විතියික මට්ටම | 1101 | 971 | 130 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 172 | 159 | 13 | -- |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | -- | 04 | -- | 04 |
| | **එකතුව** | 1,362 | 1,198 | 168 | 04 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.